**ශීර්ෂය 166 - නගර සැලැසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

නගර සැලැසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව නගර සැලැසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව නගර සැලැසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 30 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට නගර සැලැසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂය සඳහා අමාත්‍යාංශය විසින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපවන බව ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) අමාත්‍යාංශය විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අනුව අග්‍රිම ගිණුම් ශේෂය (අවාසි) රු.29,255,439,197 ක් වී තිබුණ ද, එම ශේෂය සැසඳීම සඳහා චක්‍රලේඛයේ 7(**vi**) ඡේදය ප්‍රකාරව අක් මුදල් ගැලපුම් ගිණුමක් පිළියෙල කර නොතිබුණි. | චක්‍රලේඛයේ 7(**vi**) ඡේදය ප්‍රකාරව අක් මුදල් ගැලපුම් ගිණුමක් පිළියෙල කර මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ යුතු වීම. | විගණකාධිපතිගේ නිරීක්ෂණය අනුව මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ඌණතාවයන් හඳුනාගෙන නැවත සකස් කරන ලදී. මේ සමඟ එය හා අදාල ගැලපුම් ගිණුම ඉදිරිපත් කරමි. |

### 1.6.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| යන්ත්‍ර හා උපකරණ, ගෘහ භාණ්ඩ, කාර්යාල උපකරණ හා වාහන යන වත්කම් සඳහා වූ ස්ථාවර වත්කම් ලේඛනයන් ක්‍රමවත්ව යාවත්කාලීන කර නොතිබුණි. මූල්‍ය ප්‍රකාශනයන්හි සඳහන් ස්ථාවර වත්කම් වටිනාකම ඊට අදාළ ස්ථාවර වත්කම් ලේඛනය හෝ උපලේඛන සමඟ සන්සන්දනය කර ගැනීමට නොහැකි විය. සමාලෝචිත වර්ෂය සඳහා වූ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2019 මැයි 26 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. මේ හේතූන් නිසා අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ වූ ස්ථාවර වත්කම් සතුටුදායක ලෙස සත්‍යාපනය කර ගැනීමට නොහැකි විය. | ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීනව පවත්වා ගැනීම හා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ සිදු කිරීම කළ යුතු වේ. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍ර ලේඛයේ සඳහන් පරිදි අමාත්‍යාංශය ස.ු සියළුම ස්ථාවර වත්කම් තක්සේරු කර 2018 නොවැම්බර් මාසයේදී CIGAS වැඩසටහනට ඇතුළත් කර ඇත. |

**1.6.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය රු.3,145,223,571 ක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා තිබුණි. එසේ වුවත් විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව එම වටිනාකම රු.4,829,330,588 ක් වී තිබුණි. ඒ අනුව රු.1,684,107,017ක වෙනසක් අනාවරණය විය. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු විම. | සකස් කරන ලද මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශයේ ඒ ඒ අගයන් සම්බන්ධ පැහැදිලි කිරීම් මෙසේය.<br>මුදල් ප්‍රවාහ ප්‍රකාශය සඳහා ඇතුළත් කර ඇත්තේ සත්‍ය වශයෙන්ම මුදලින් සිදු වූ ලැබීම් හා ගෙවීම් පමණි. එහෙයින් ඔබ විසින් සඳහන් කරනු ලැබ ඇති වෙනස්කම් මුදලින් නොවන (හරස් සටහන්) ලැබීම් හා ගෙවීම් ද සැලකිල්ලට ගැනීම නිසා සිදු වූවකි.<br>තවද මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය සැකසීමේ දී රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ 267/2018 දරන චක්‍රලේඛ මඟින් හඳුන්වා දී තිබූ ආකෘතියට අනුගත වීමට සිදු විය. එබැවින් ඔබගේ විගණන විමසුමේ සඳහන් කර ඇති පරිදි තැන්පත් ගෙවීම්, තැන්පත් ලැබීම්, ප්‍රේෂණ, අත්තිකාරම් ආපසු අයකර ගැනීම හා ආපසු ගෙවීම යටතේ අගයන් සඳහන් කිරීමට ස්ථානයක් නොතිබුණි. |
| (ආ) මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය රු.182,009,485ක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා තිබුණි. එසේ වුවත් විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව එම වටිනාකම රු.4,824,079,483 ක් වී තිබුණි. ඒ අනුව රු.4,642,069,998ක වෙනසක් අනාවරණය විය. | - එම - | |
| (ඇ) ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහ වෙනුවෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කිසිදු වටිනාකමක් දක්වා නොතිබුණද, විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව රු.5,748,706 ක අත්තිකාරම් ආපසු අයකර ගෙන තිබුණත්, එම වටිනාකම එහි ඇතුළත් කර නොතිබුණි. | - එම - | |
| (ඈ) ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය යටතේ භෞතික වත්කම් ඉදි කිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් වෙනුවෙන් රු.25,314,342,647 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා තිබුණි. එසේ වුවද විගණනයට ඉදිරිපත් කරන ලද | - එම - | |

| | | | |
|---|---|---|---|
| | තොරතුරු වලට අනුව භෞතික වත්කම් අත්පත් කර ගැනීම වෙනුවෙන් රු.4,361,182 ක් ද, අත්තිකාරම් ගෙවීම සඳහා රු.6,638,629 ක් ද වශයෙන් රු.10,999,811 ක් පමණක් වී තිබුණි. ඒ අනුව රු.25,303,342,836 ක වෙනසක් අනාවරණය විය. | | |
| (ඉ) | අමාත්‍යාංශය මූල්‍ය ක්‍රියාකාරකම්වල යෙදී නොතිබුණත්, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ විදේශ ණය ගැනීම් රු.22,232,612,914 ක් හා විදේශාධාර ව්‍යාපෘති සඳහා රු.115,351,186 ක් දක්වා තිබුණි. | - එම - | |

**1.6.4 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | **ඇප ලේඛනය** | | |
| | ඇප තැබිය යුතු නිලධාරීන් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප ලේඛනයක් පවත්වා ගත යුතු වීම. | ඇප තැබිය යුතු නිලධාරීන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් නඩත්තු කර නොමැත. |
| (ආ) | **බැරකම් පිළිබඳ ලේඛනය** | | |
| | බැරකම් පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් ලේඛනයක් පවත්වා ගත යුතුවීම. | නඩත්තු කර නොතිබු බව පිළිගනිමි. එහෙත් බැරකම් පිළිබඳ සියළු තොරතුරු සිගාස් ගිණුම්කරණ පද්ධතියට ඇතුළත් කර යාවත්කාලීන කර ඇත. |
| (ඇ) | **වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනය** | | |
| | වාහන ලැයිස්තුගත කිරිමේ ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 1647(ඉ) ප්‍රකාර වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනය යාවත්කාලීනව පවත්වාගත යුතුවීම. | මු.රෙ.1647(ඉ) රෙගුලාසි වලට අදාළව මේ වන විට මෝටර් වාහන පිළිබඳ ලැයිස්තුව යාවත්කාලීන කර ඇත. |

**1.6.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | **නිරීක්ෂණය** | | | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|---|---|
| | **නීති,රීති හා රෙගුලාසිවලට යොමුව** | **වටිනාකම** | **අනුකූල නොවීම** | | |
| | | රු. | | | |
| (අ) | **ශ්‍රී ලංකාවේ ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | | |
| | (i) මුදල් රෙගුලාසි 371 | 44,701 | අවස්ථා 4 කදී විවිධ කාර්යයන් සඳහා නිකුත් කර තිබුණු රු.44,701 ක් වූ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය අවසන් වී දින 10 කින් නිරවුල් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව තත්කාර්ය අතුරු අග්‍රිම ගිණුම කාර්ය නිමවී දින 10 ක් ඇතුළත නිරවුල් කළ යුතුව ඇත. | එකඟ වෙමි. |
| | (ii) මුදල් රෙගුලාසි 170 (2) (අ) | 10,000,000 | ගංවතුර ආධාර වෙනුවෙන් 2017 වර්ෂයේදී වෙනත් ආයතනයකින් ලද රු. මිලියන 10 ක පරිත්‍යාග රාජ්‍ය ආදායමට බැර නොකර තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. එම මුදලින් ගංවතුර ආධාර නොවන වෙනත් කටයුතු සඳහා 2017 හා 2018 වර්ෂයන්හි දී පිළිවෙලින් රු.1,000,678 ක් හා රු.1,494,865 ක් වැය කර තිබුණි. | මුදල් රෙගුලාසි 170 (2) (අ) ප්‍රකාරව කටයුතු කර එම තැන්පතු රාජ්‍ය ආදායමට බැර කිරීම හෝ නිරවුල් කිරීම හෝ කළ යුතුව ඇත. | එකඟ වෙමි. |
| (ආ | 2016 මාර්තු 31 | - | 2018 වර්ෂය සඳහා වාර්ෂික | රාජ්‍ය මුදල් | භාණ්ඩ |

| | | | | |
|---|---|---|---|---|
| ) | දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ.1.6 ඡේදය | භාණ්ඩ සමීක්ෂණය සිදු කර එම වාර්තා 2019 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, 2019 මැයි 26 දින වන විටත් එම වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | චක්‍රලේඛයේ 3.1.6 ඡේදය ප්‍රකාරව කටයුතු කළ යුතුව ඇත. | සමීක්ෂණයේදී මතු වූ ගැටළු නිරාකරණය කර ගැනීමට සිදුවීම හේතුවෙන් නියමිත දිනට අදාළ වාර්තාව යොමු කිරීමට නොහැකි වූ අතර, එය කඩිනමින් විගණකාධිපති වෙත යොමු කිරීමට අවශ්‍ය කටයුතු කර ඇත. |
| (ඇ ) | 2017 ජුනි 28 දිනැති අංක 01/2017 දරන මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ චක්‍රලේඛයේ 07 ඡේදය | ආයතනය සතු සියලු වත්කම් සම්බන්ධ විස්තර කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත ලබා දිය යුතු වුවද, එසේ කටයුතු කර නොතිබුණි. | ආයතනය සතු සියලු වත්කම් සම්බන්ධ විස්තර කොම්ප්ට්‍රොලර් ජනරාල්වරයා වෙත නියමිත දිනට ලබා දීමට කටයුතු කළ යුතු වේ. | ආයතනය සතු සියලු වත්කම් සම්බන්ධ විස්තර කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත 2019.05.22 විද්‍යුත් තැපෑලෙන් යවා ඇත. |

**2. මූල්‍ය සමාලෝචනය**

------------------------

**2.1 අග්‍රිම කළමනාකරණය**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ සංවර්ධන වැඩසටහන් ව්‍යාපෘති 14 ක ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 5,127 ක් විය. එසේ වුවද, එම ව්‍යාපෘතිවල වියදම රු.මිලියන 3,009.4 ක් වූ අතර රු.මිලියන 2,117.6 ක් හෙවත් සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 41 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු නිවැරදිව පිළියල කිරීම සිදු කළ යුතුවීම. | අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ ඇති ආයතන විසින් ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘතිවල වියදම් සඳහා ප්‍රධාන වශයෙන් මහා භාණ්ඩාගාරයෙන් ප්‍රමාණවත් පරිදි අක් මුදල් නොලැබීම, කොන්ත්‍රාත්කරුවන් වෙත මුදල් නිසි පරිදි නොගෙවීම නිසා ඔවුන් වැඩ ප්‍රමාද කිරීම සහ ප්‍රමාද වී බිල්පත් ඉදිරිපත් කිරීම ප්‍රතිපාදන ඉතිරි වීමට හේතු විය. |

## 2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **ශුද්ධ ප්‍රතිපාදන මුළුමනින්ම ඉතිරි කිරීම** | | | |
| **(අ)** | පුනරාවර්තන වැය විෂයය දෙකක සළසා තිබුණු රු.125,000 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් කිසිදු උපයෝජනයක් නොකර එම මුළු ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව වාර්ෂික වියදම් ඇස්තමේන්තු නිවැරදිව පිළියල කළ යුතු වේ. | 166-01-11-1203 - රු. 25,000 - රාජ්‍ය අමාත්‍ය කාර්යාලයේ සේවකයින් සඳහා නිල ඇඳුම් දීමනා ලබා දීමට මෙම මුදල ඇස්තමේන්තු කළද, නිල ඇඳුම් ලබා ගැනීමට සුදුසුකම් ඇති නිලධාරීන්ගෙන් ඒ සඳහා ඉල්ලීම් ඉදිරිපත් නොවීම ප්‍රතිපාදන ඉතිරි වීමට හේතු විය.<br><br>166-01-11-1409- රු.100,000 වසරේ වැඩි කාලයක රාජ්‍ය අමාත්‍ය ධූරය සඳහා ස්ථිරව පත් නොකිරීම හේතුවෙන් අපේක්ෂා කළ පරිදී වියදම් ඇති නොවීම නිසා ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන වැය විෂයයන් සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය සහිතව මු.රෙ.66 මඟින් ප්‍රතිපාදන මාරු කරන ලදී. |
| (ආ) | මූලධන වැය විෂයය 02 ක් සඳහා සලසා තිබුණු රු.375,000 ක ශුද්ධ ප්‍රතිපාදනය කිසිදු උපයෝජනයක් නොකර සම්පූර්ණයෙන්ම ඉතිරි කර තිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව වාර්ෂික වියදම් ඇස්තමේන්තු නිවැරදිව පිළියල කළ යුතු වේ. | වසරේ වැඩි කාල පරිච්ඡේදයක් සඳහා රාජ්‍ය අමාත්‍යවරයෙක් පත් නොකිරීම හේතුවෙන් අපේක්ෂා කල පරිදි වියදම් උද්ගත නොවීම ප්‍රතිපාදන සම්පූර්ණයෙන් ඉතිරි වීමට හේතු විය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 සැලැසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2014 පෙබරවාරි 17 දිනැති අංක 2014/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2018 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණද, එම චක්‍රලේඛයේ 3 ඡේදය ප්‍රකාරව පහත සඳහන් කරුණු ඇතුළත් කර නොතිබුණි.<br>• සමාලෝචිත වර්ෂය සඳහා යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය,<br>• අනුමත කාර්ය මණ්ඩලය සහ දැනට සේවයේ සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර.<br>• වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක් මුදල් අවශ්‍යතා සැලැස්ම.<br>• සැලසුම් කර ඇති ප්‍රධාන සංවර්ධන වැඩසටහන් වෙනුවෙන් වන වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම.<br>• අභ්‍යන්තර විගණන සැලැස්ම. | රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූල වන සේ ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කළ යුතු වීම | 2018 වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම සඳහා පාදක කරගනු ලැබුවේ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය විසින් නිකුත් කළ MNPEA/ PLN/ APG/ 15 අංක හා 2015.10.14 දිනැති ලිපිය වේ. එම ලිපිය මගින් දන්වා ඇති උපදෙස් අනුව 2014/01 රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ සඳහන් පහත කරුණු ඇතුළත් විය යුතු නොවේ.<br>(අ) සමාලෝචිත වර්ෂයට යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය සහ දැනට සේවයේ සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර.<br>(ආ) වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක්මුදල් අවශ්‍යතා සැලැස්ම.<br>(ඇ) අභන්තර විගණන සැලැස්ම. |

**3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

**------------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| --------------------- | ----------- | --------------------------- |
| (අ) 2018 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව ක්‍රියාත්මක කළ යුතුව තිබුණු ව්‍යාපෘති 6ක 2018 දෙසැම්බර් 31 දිනට අපේක්ෂිත ප්‍රගතිය සියයට 5 ක සිට සියයට 69 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. වාර්ෂික කාර්යසාධන වාර්තාව අනුව එම ව්‍යාපෘති 6 හි තථ්‍ය කාර්යසාධනය සියයට 4ක සිට සියයට 39 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. ඒ අනුව අපේක්ෂිත කාර්යසාධන මට්ටමට වඩා සියයට 1 ක සිට සියයට 23 ක් දක්වා පරාසයක ප්‍රමාණයකින් තථ්‍ය කාර්යාසාධන මට්ටම අඩුවී තිබුණි. | වර්ෂය ආරම්භයේදී සැලැසුම් කළ පරිදි අදාළ ප්‍රගතීන් කරා ළඟා වීමට කටයුතු කළ යුතු වීම. | ICB 04 කොන්ත්‍රාත් ගිවිසුම සඳහා AFD ප්‍රතිපාදන ලබා දීම අත්හිටුවීම හේතුවෙන් ඉදිකිරීම් කටයුතු ඇන හිටීම.<br><br>ICB 03 කොන්ත්‍රාත් ගිවිසුම 2018 සැප්තැම්බර් මාසයේ පිරිනැමුවද, කොන්ත්‍රාත්කරු ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම 2019 මාර්තු මාසය දක්වා ප්‍රමාද කිරීම.<br><br>යෝජිත බස්නාගොඩ ජලාශය ඉදිකිරීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීමට ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති වීම නිසා ඉදිකිරීම් ප්‍රමාද වීම.<br><br>නැබැඩ හා මතුගම ජල කුළුණු ඉදිකිරීම සඳහා ඉඩම් අත්පත්කර ගැනීමේ ප්‍රමාදයන් සිදු වීම. සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ ජල නල එළීමේදී මාර්ග සංවර්ධන අධිකාරියේ අවසර ලබා දීම ප්‍රමාද වීම.<br><br>ප්‍රධාන කොන්ත්‍රාත්කරු විසින් උප කොන්ත්‍රාත්කරු හට ගෙවීම් නිසියාකාරව නොකිරීම නිසා උප කොන්ත්‍රාත්කරු ඉදිකිරීම් කටයුතු නවතා දැමීම.<br><br>ජල නල එළීම ප්‍රමාද වීම, ඉඩම් අත්පත් කර ගැනීමේ |

| | | | |
|---|---|---|---|
| | | | ප්‍රමාදයන් සිදු වීම හා රත්තොට ජල මූලාශ්‍රය ගොවි සංවිධාන වල විරෝධතා හේතුවෙන් ව්‍යාපෘතිය වෙනස් කිරීමට සිදු වීම. |
| | | | ප්‍රධාන ජල මූලාශ්‍රය වන රාජාංගනය වැව ව්‍යාපෘතිය සඳහා යොදා ගැනීමට ගොවි සංවිධාන වල දැඩි විරෝධයක් මතු වීම හේතුවෙන් ව්‍යාපෘතියේ අනෙකුත් ඉදිකිරීම් කටයුතුද ප්‍රමාද වීම. |
| (ආ) | අමාත්‍යාංශය විසින් සෘජුව ක්‍රියාත්මක කරන ලද සමාලෝචිත වර්ෂය තුළ නිම කළ යුතුව පැවති කාලීන වකුගඩු රෝග නිවාරණ වැඩසටහන, ග්‍රාමීය ජල සම්පාදන හා සනීපාරක්ෂාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය, වැසි ජල ටැංකි ස්ථාපනය කිරීමේ වැඩසටහන සහ SACOSAN වැඩසටහන සමාලෝචිත වර්ෂය අවසානය වන විට අපේක්ෂිත පරිදි නිම කර ගැනීමට නොහැකිව පැවතුණි. | වර්ෂය ආරම්භයේදී සැලැසුම් කළ පරිදි අදාළ ප්‍රගතීන් කරා ළඟා වීමට කටයුතු කළ යුතු ය. | අමාත්‍යාංශ පරිශ්‍රයේ ඉදිරිකිරිමට සැලැසුම් කළ වැසි ජල ව්‍යාපෘතිය නගර සැලැසුම් අංශය සඳහා ඉදිකිරිමට යෝජිත ගොඩනැගිල්ලේ ස්ථාපිත කිරීමට සැලැසුම් කර තිබුණත්, එම ගොඩනැගිල්ල සැලැසුම් කළ පරිදි ඉදි නොවීම, SACOSAN වැඩසටහනට අදාළ ප්‍රතිපාදන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයවලට ලබා දී තිබුණත්, එම කාර්යාල සඳහා අග්‍රිම භාණ්ඩාගාරය විසින් ලබා නොදීම, කාලීන වකුගඩු අකරණ රෝග නිවාරණය වැඩසටහන අවශ්‍ය ප්‍රමාණවත් අක් මුදල් නොලැබීම හා ග්‍රාමීය සනීපාරක්ෂාව වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා අක් මුදල් නොලැබීම නිසා අපේකෂිත පරිදි ව්‍යාපෘති නිම කිරිමට නොහැකි විය. |

**3.3 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

**-------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| --------------------- | | ----------- | --------------------- |
| (අ) | කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යසාධනය, ඉඩම් නිරවුල් කර ගැනීමේ ප්‍රමාදයන්, කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේ ප්‍රමාදයන්, පාරිසරික, නැවත පදිංචි කිරීමේ ප්‍රමාදයන් යනාදී හේතු නිසා එකතුව රු.මිලියන 90,624 ක්වූ ව්‍යාපෘති 07ක් සැලසුම් කළ දිනය ඉක්මවා දින 349 ක සිට දින 2009 දක්වා කාල පරාසයක ප්‍රමාදයක් කර තිබුණු අතර එම ව්‍යාපෘති නිම කිරීම සඳහා කාලය ඉක්මවා කොන්ත්‍රාත් දිගුවන් ලබා දී තිබුණි. ඒ හේතුවෙන් එම ව්‍යාපෘති නිම කිරීමේදී සැලකිය යුතු ප්‍රමාදයක් පැවතුණි. | සැලසුම් කළ පරිදි ව්‍යාපෘති නිම කිරීමට ක්‍රියාමාර්ග ගැනීම කළ යුතුව ඇත. | මෙහි දක්වා ඇති කරුණු පිළිබඳව එකඟ වේ. |
| (ආ) | හම්බන්තොට අන්දරගස්යාය භූගත ටැංකියේ සිට ගන්නොරුව දක්වා ජල නල එළීම - අදියර II ව්‍යාපෘතිය සඳහා 2015 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා රු.මිලියන 304.93 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණි. 2018 වර්ෂය ආරම්භ වන විට ඉන් රු.මිලියන 16.99 ක ප්‍රතිපාදන පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු.මිලියන 287.94 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි. වර්ෂය සඳහා සලසා තිබූ ප්‍රතිපාදන උපයෝජනය නොකර ව්‍යාපෘතිය 2018 දෙසැම්බර් 31 වන විටත් නිම කිරීමට අපොහොසත් වී තිබුණි. | විධිමත්ව සැලැසුම් පිළියෙල කර ඒ අනුව ප්‍රතිපාදන ලබාගෙන ව්‍යාපෘතිය කඩිනමින් අවසන් කිරීමට කටයුතු කළ යුතුව ඇත. | මේ යටතේ ප්‍රදානය කරන ලද බඳගිරිය ජල සම්පාදන ක්‍රමය සඳහා DI පයිප්ප සහ අනෙකුත් උපාංග සැපයීම හා ප්‍රවාහනය සඳහා වූ කොන්ත්‍රාත්තුවේ 2018 දෙසැම්බර් 31 දිනට භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 75 ක් හා සියයට 65 ක් වේ. තවද බඳගිරිය ජලසම්පාදන ක්‍රමයේ මිලිමීටර් 300 ක විශ්කම්භයෙන් යුතු ජල නල එළීමේ කොන්ත්‍රාත්තුව හා ජල මට්ටම නිරීක්ෂණ පද්ධතියක් සැපයීමේ කොන්ත්‍රාත්තුව මේ වන විට අවසන්ව වී ඇත. |
| (ඇ) | කෑගල්ල දිස්ත්‍රික්කයේ නැවත පදිංචි කිරීමේ ගම්මාන සඳහා ජල සැපයුම් පහසුකම් ලබා දීමේ ව්‍යාපෘතිය සඳහා 2017 වර්ෂයේදී රු.මිලියන 158.00 ක්ද, 2018 වර්ෂයේදී රු.මිලියන112.00 ක්ද | විධිමත් සැලැසුම් පිළියෙල කර ඒ අනුව ප්‍රතිපාදන ලබා ගෙන ව්‍යාපෘතිය කඩිනමින් අවසන් කිරීමට කටයුතු කළ යුතුව ඇත. | රුපියල් මිලියන 197 ක ප්‍රතිපාදන 2018 වර්ෂය සඳහා වෙන් කල අතර එයින් රුපියල් මිලියන 85 ක ප්‍රතිපාදන වසර අවසානයේ මණ්ඩලයේ වෙනත් ව්‍යාපෘති |

| | | |
|---|---|---|
| වශයෙන් එකතුව රු.මිලියන 270 ක ප්‍රතිපාදන ලබා ගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට එම ප්‍රතිපාදනවලින් රු.මිලියන 120.93 ක ප්‍රතිපාදන පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු.මිලියන 149.07 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි. ව්‍යාපෘතිය සඳහා පාර්ලිමේන්තුව විසින් ප්‍රතිපාදන සලසා තිබුණත් අපේක්ෂිත පරිදි ව්‍යාපෘති කටයුතු නිම කිරීමට අපොහොසත් වී තිබුණි. | | නිමකිරීම සඳහා වෙනත් වැය ශීර්ෂයකට මාරු කරන ලදී. ඒ අනුව රුපියල් මිලියන 90 ක් වසර තුලදී වියදම් කල අතර, ඉතිරි රුපියල් මිලියන 21 ක මුදල වියදම් කිරීමට නොහැකි වූයේ එම දිනවල රජයේ ඇතිවූ අස්ථාවරභාවය නිසා කොන්ත්‍රාත්කරුවන් ගේ බිල්පත් ඉදිරිපත් කලත් ඒ සඳහා ගෙවීමට නොහැකිවීම සහ ඒ හේතුවෙන් ඉදිකිරීම් නිසි පරිදි සිදු නොවීම නිසා බව සබරගමුව ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථානය යටතේ කෑගල්ල සහකාර සාමාන්‍යාධිකාරීතුමා මඟින් දන්වා ඇත. |

## 3.4 වාර්ෂික කාර්යසාධන වාර්තාව

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| 2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා වූ කාර්යසාධන වාර්තාව අමාත්‍යාංශය විසින් 2019 අප්‍රේල් 11 දින පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා ඉදිරිපත් කර තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| (අ) විගණනයට අනාවරණය වූ පරිදි මාතර IV ව්‍යාපෘතියේ සහ තඹුත්තේගම ජල සම්පාදන ව්‍යාපෘතියේ වර්ෂයේ අවසානයට භෞතික ප්‍රගතිය පිළිවෙලින් සියයට 9 ක් හා සියයට 5 ක් වී තිබුණත්, කාර්යසාධන වාර්තාවෙහි පිළිවෙලින් සියයට 12 ක් හා සියයට 4 ක් ලෙස දක්වා තිබුණි. | වාර්ෂික කාර්යසාධන වාර්තාවේ දත්තයන් නිවැරදිව සකස් කළ යුතු අතර එය වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව සන්සන්දනය කළ හැකි පරිදි පිළියෙල කළ යුතුවීම. | වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කිරීම ඒ ඒ ආයතනවලින් ලබාගත් තොරතුරු පදනම් කර ගනිමින් සිදු කරනු ලබයි. ඒ අනුව මාතර අදියර IV සහ තඹුත්තේගම ජල සම්පාදන ව්‍යාපෘතිවලට අදාළ තොරතුරු මූලාශ්‍රය වී ඇත්තේ ජාතික ජලසම්පාදන මණ්ඩලය |

| | | | |
|---|---|---|---|
| | | | විද්‍යුත් තැපැල හරහා අප වෙත ඉදිරිපත් කළ තොරතුරු වේ. |
| (ආ) | අමාත්‍යාංශයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුළ අන්තර්ගත නොවූ දේශීය බැංකු ණය අරමුදල් යටතේ ක්‍රියාත්මක ජල සම්පාදන ව්‍යාපෘතීන්හි කාර්යසාධනය පිළිබඳව වාර්ෂික කාර්යසාධන වාර්තාවේ දක්වා තිබුණි. සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාකාරී සැලැස්ම සහ වාර්ෂික කාර්යසාධන වාර්තාව සංසන්දනය කිරීමට නොහැකි විය. | | වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සකස් කිරීමේ දී ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය විසින් එවා ඇති ලිපියේ උපදෙස් අනුව වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මට ඇතුළත් කළ යුතු වනුයේ මූල්‍ය ප්‍රතිපාදන තහවුරු කරගත් ව්‍යාපෘති පමණි. වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සකස් කරන අවස්ථාව වනවිට මූල්‍ය ප්‍රතිපාදන ලැබීම තහවුරු වී නොතිබූ බැවින් ව්‍යාපෘති පිළිබඳ තොරතුරු ඇතුළත් කර නොමැත. නමුත් වාර්ෂික කාර්යසාධන වාර්තාව සඳහා අමාත්‍යාංශයේ සමස්ත ප්‍රතිපාදන පිළිබඳ තොරතුරු ඇතුළත් කළ යුතු හෙයින් දේශීය බැංකු ණය අරමුදල් යටතේ ක්‍රියාත්මක ජලසම්පාදන ව්‍යාපෘති පිළිබඳ තොරතුරු ඇතුළත් කර ඇත. |

**3.5 දේශීය අරමුදල්වලින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘති**

**--------------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| **---------------------** | **----------** | **-------------------------------** |
| මාතර අදියර IV ජල සම්පාදන ව්‍යාපෘතිය සම්බන්ධයෙන් වූ අකාර්යක්ෂම ප්‍රසම්පාදන ක්‍රියාවලිය හේතුවෙන් ව්‍යාපෘතිය සඳහා ලංසු කැඳවීමේ සිට තෝරා ගත් කොන්ත්‍රාත්කරුට, කොන්ත්‍රාත්තුව | ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් කාල වකවානු තුළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්මෙහි වූ ප්‍රසම්පාදන සැලැස්ම විධිමත් හා නිවැරදිව පිළියල කිරීමත්, ඒ | මෙම ව්‍යාපෘතිය සඳහා මුලින් විදේශ ණය දෙන ආයතනයක් හඳුනාගෙන තිබුණද, අයවැය ප්‍රතිපාදන සීමා කිරීම හේතුකොට ගෙන ඒ සඳහා අරමුදල් සැපයීම |

| | | |
|---|---|---|
| ප්‍රදානය කිරීම දක්වා 2011 ජූනි මාසයේ සිට 2016 ජූලි මාසය දක්වා වර්ෂ පහකට අධික කාලයක් ගත වී තිබුණි. තවද සමාලෝචිත වර්ෂය අවසාන වන විට එය ව්‍යාපෘතියේ ප්‍රගතිය සියයට 12 ක් වැනි ඉතා පහළ මට්ටමක පැවතුණි. | අනුව ප්‍රසම්පාදන කටයුතු ඉටු කර ගැනීමත් සිදුකළ යුතුව ඇත. | කල් දමන ලදී. පසුව මුදල් අමාත්‍යාංශය විසින් දේශීය අරමුදල් සැපයීමට එකඟතාවය පළ කිරීම නිසා නැවත දේශීය අරමුදල් මගින් ක්‍රියාත්මක කිරීමට ඇස්තමේන්තු කරන ලදී. එසේම යෝජිත ඉඩම පවරා ගැනීමට කාලයක් ගත වීමද ප්‍රමාද වීමට හේතු විය. |

**3.6 වත්කම් කළමනාකරණය**

**------------------------------**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | --------------------- | ---------- | ------------------------ |
| (අ) | **ධාවනයට යොදා නොගන්නා වාහන**<br>**--------------------------------** | | |
| | 2019 ජනවාරි 24 දින සිදු කළ ස්ථානීය පරීක්ෂාවේදී මොටර් රථ 05 ක්, කැබ් රථ 03 ක් හා ජීප් රථයක් ධාවනයට යොදා ගැනීමෙන් තොරව අමාත්‍යාංශ භූමියේ ආවරණයක් රහිතව ගාල් කර තිබුණි. | ධාවනයට යොදා නොගන්නා වාහන තිබේ නම් ඒවා අලුත්වැඩියා කිරීමට හෝ වෙන්දේසි කිරීමට පියවර ගත යුතු වේ. | 2018 වර්ෂයේ අපහරණ ක්‍රියාවලිය යටතේ වාහන කිහිපයක් වෙන්දේසි සඳහා යොමු කළද, එම වාහන වෙන්දේසිකරුවන් නොමැතිවීම හේතුවෙන් වෙන්දේසි නොවුණි. එසේම මෙම වසරේදී අපහරණ ක්‍රියාවලිය යටතේ එම රථ සහ භාවිතයට නොගන්නා වාහන පරීක්ෂා කිරීමෙන් පසු වෙන්දේසි කිරීමට අවශ්‍ය කටයුතු කරගෙන යනු ලැබේ.<br>එසේම ජීප් රථය පරිසර අමාත්‍යාංශය වෙත නැවත භාරදීම සඳහා කටයුතු මේ වන විට සිදුකරමින් පවතී.<br><br>රථයක් ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව විසින් එම දෙපාර්තමේන්තුවේ ගාල් කිරීමේ පහසුකම් නොමැතිවීම හේතුවෙන් |

| | | | |
|---|---|---|---|
| | | | අමාත්‍යාංශ පරිශ්‍රය තුළ ගාල් කර ඇත.<br><br>නිවාස වැවිලි හා යටිතල පහසුකම් අමාත්‍යාංශයට අයත් වාහන දෙකක් එම අමාත්‍යාංශ එකඟතාව මත වයඹ පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත භාරදී ඇත.<br>අමාත්‍යාංශයේ දැනට ඇති රථ අංගනය නිලධාරීන්ගේ වාහන වලට ප්‍රමාණවත් නොවන බැවින් සහ අනෙකුත් ගාල් කර ඇති වාහන සඳහා රථ අංගනයත් ඉදිකිරීමට අවශ්‍ය කටයුතු කරමින් පැවතුණි. |
| (ආ) | **වෙනත් රාජ්‍ය ආයතන සතු වාහන පරිහරණය කිරීම**<br>--------------------------------<br>නගර සැලසුම්, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව වෙනත් රාජ්‍ය ආයතන සතු වාහන 11 ක් අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂයේදී පරිහරණය කර තිබුණි. | විධිමත්ව පවරා ගැනීමට හෝ අදාළ ආයතනවලට මුදා හැරීමට කටයුතු කළ යුතු වේ. | මේ වන විට එක් රථයක් මහනගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශට සහ තවත් රථයක් දේශීය වෛද්‍ය අමාත්‍යාංශය වෙත දැනට භාර දී ඇත.<br>එසේම ජීප් රථය පරිසර අමාත්‍යාංශය වෙත නැවත භාරදීම සඳහා කටයුතු මේ වන විට සිදු කරමින් පවතී.<br>මෙම අමාත්‍යාංශය විටින් විට අමාත්‍යවරු මාරු වීම සහ ලේකම්වරු මාරුවීම හේතුවෙන් එම අමාත්‍යවරු සහ ලේකම්වරු මෙම අමාත්‍යාංශය වෙත ගෙන එන ලද වාහන එම නිලධාරීන් විශ්‍රාම යාමෙන් පසු මෙම අමාත්‍යාංශයේ නිලධාරීන් ගේ භාවිතය සඳහා ගෙන ඇත. නිලධාරීන් සඳහා භාවිතයට සුදුසු තත්ත්වයේ |

| | | |
|---|---|---|
| | | වාහන මෙම අමාත්‍යාංශය සතුව නොමැති බැවින් එම වාහන අමාත්‍යාංශ නිලධාරීන්ගේ භාවිතය සඳහා යොදාගෙන ඇත.<br>අමාත්‍යාංශය සතුව අලුතින් වාහන ලබා ගැනීම සඳහා ප්‍රතිපාදන නොමැති බැවින් හා කුලී පදනම මත වාහන ලබා ගැනීමට වඩා මෙම අමාත්‍යාංශය යටතේ ඇති ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මඟින් වාහන ලබා ගැනීම ආර්ථික වශයෙන් වාසිදායක විය. ඒ අනුව ගරු අමාත්‍යතුමා සහ ගරු රාජ්‍ය අමාත්‍යතුමාගේ කාර්යය මණ්ඩල සඳහා භාවිතයට සුදුසු තත්ත්වයේ වාහන නොමැති බැවින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙතින් වාහන භාවිතයට ගෙන ඇත. |

## 3.7 රජයේ නිලධාරීන්ට ඇප තැබීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| මුදල් රෙගුලාසි සංග්‍රහයේ 128(1)(ග) රෙගුලාසිය ප්‍රකාරව ඇප තැබීමට බැඳී සිටින නිලධාරීන් එවකට වලංගු නීතිය හා නියමයන් අනුව ඇප තැබිය යුතු වුවද එසේ ඇප තබා නොතිබුණි. | ඇප අය කර ගත යුතු නිලධාරීන්ගෙන් ඇප ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. | එකඟවෙමි. ඇප තැබීමට බැඳී සිටින නිලධාරීන්ගෙන් අදාළ ඇප මුදල්, මුදල් රෙගුලාසි හා අණපනත් ප්‍රකාරව තැන්පත් කිරීමට ඉදිරියේ දී කටයුතු කරමි. |

**4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ තිරසාර සංවර්ධනය අරමුණ ලෙස පිරිසිදු ජලය සහ සනීපාරක්ෂාව සැපයීම හඳුනාගෙන තිබූ අතර සංවර්ධනය තුළින් නලජලය සැපයීම ක්‍රියාත්මක කිරීම හා මලාපවහන හා ප්‍රතීක ප්‍රතිචක්‍රීකරණය (Septage treatment) ක්‍රියාත්මක කිරිමට ඉලක්කගත කර තිබුණි. සැමට ආරක්ෂිත පානීය ජලය හා සනීපාරක්ෂාව, දර්ශක ලෙස දක්වා තිබුණි. තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක කරා ළඟාවීම සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන පාර්ශවයන් හඳුනාගෙන ඇති අතර ඒ අය සඳහා වැඩසටහන් මගින් දැනුවත් කිරීම් සිදු කර තිබුණි. කෙසේ වෙතත් මේ සම්බන්ධයෙන් කිසිදු චක්‍රලේඛයක් මේ වන විට නිකුත් කර නොතිබුණි. | තිරසර සංවර්ධනය සම්බන්ධයෙන් වූ චක්‍රලේඛයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අදාළ පරිදි දැනුවත් කිරීම් සිදුකළ යුතුව ඇත. | අදහස් දක්වා නැත. |

**5. මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2017 අගෝස්තු 29 දිනැති අංක ඩීඑම්එස්/7777/ඩබ්එස්එස්අයිපී දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු ලිපිය පරිදි ජල සැපයුම් හා සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා කොන්ත්‍රාත් පදනම මත වර්ෂ 4 ක කාලය සඳහා වැඩසටහන් නිලධාරීන් තිදෙනෙකු අනුමත කර තිබුණි. | 2016 මාර්තු 24 දිනැති අංක 1/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුව කටයුතු කළ යුතුව ඇත. | මේ සඳහා හිටපු අමාත්‍යාංශ ලේකම් විසින් නිර්දේශ කර අනුමත කරන ලද අමාත්‍යාංශ නිලධාරීන් දෙදෙනෙකුගේ සේවය අර්ධකාලීනව ලබා ගැනීමට සිදු විය. |

එසේ වුවද 2016 මාර්තු 24 දිනැති අංක 01/2016 කළමනාකරණ සේවා චක්‍රලේඛයට පටහැනිව අමාත්‍යාංශයේ නිලධාරීන් දෙදෙනෙකු අර්ධ කාලීනව සේවයේ යොදවා තිබුණි.

(ආ) වෙනත් පාර්ශවයන්ගෙන් ලබාගත් මානව සම්පත්

-------------------------------------

| | | | |
|---|---|---|---|
| **(i)** | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ලද තොරතුරු අනුව තනතුරු 09 කට අයත් මණ්ඩලයේ සේවකයින් 85 දෙනෙකු 2018 වර්ෂයේදී අමාත්‍යාංශය වෙත නිදහස් කර තිබුණි. | වෙනත් පාර්ශවයන්ගෙන් ලබා ගත් මානව සම්පත් අදාළ ආයතන වෙත නැවත නිදහස් කළ යුතුවීම. | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙන් සේවකයින් 85 දෙනෙකු අමාත්‍යාංශය වෙත නිදහස් කර තිබුණ ද, 2018 වර්ෂයේ අමාත්‍යාංශයට අනුයුක්තව සේවයේ යෙදී ඇති සංඛ්‍යාව 19 දෙනෙකි. |
| **(ii)** | අමාත්‍යාංශය විසින් විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව 2018 දෙසැම්බර් 31 දිනට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සේවකයන්/ නිලධාරීන් 19 දෙනෙකු පමණක් අමාත්‍යාංශයේ සේවය කරන බව වාර්තා කර තිබුණි. එම සේවකයන්/ නිලධාරීන් විවිධ තනතුරු යටතේ එනම් ඉංජිනේරු, ජ්‍යෝෂ්ඨ ප්‍රමාණ සමීක්ෂක, ඉංජිනේරු සහකාර, මනු සටහන්කරු හා රියදුරු යනාදි වශයෙන් 1995, 2012, 2013 සිට 2018 යනාදි වර්ෂවල සිට අමාත්‍යාංශයේ සේවය කර තිබුණි. | - එම - | අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය පුරප්පාඩුව පවතින නිසා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ නිලධාරීන් 19 දෙනෙකු සේවය සඳහා ලබා ගෙන ඇත. |
| **(iii)** | 2015 දෙසැම්බර් මාසයේ සිට 2018 දෙසැම්බර් මාසය දක්වා වසර තුනක කාල සීමාව තුළ එම සේවකයන් වෙනුවෙන් වැටුප් හා වේතන ලෙස රු.මිලියන 141 ක් ජාතික | අමාත්‍යාංශයේ පුරප්පාඩු සේවක සංඛ්‍යාව ලබා ගෙන ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සේවකයින් නිදහස් කළ යුතුවීම. | අමාත්‍යාංශයේ රාජකාරි සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙන් අනුයුක්ත කර ඇති නිලධාරීන් සඳහා අමාත්‍යාංශයෙන් වැටුප් ගෙවීමක් සිදු කර |

| | | |
|---|---|---|
| ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ගෙවා තිබුණි. | | නොමැත. |